**කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය (බස්නාහිර පළාත)**

# සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත)

## සත්ව පාලන පුහුණු මධ්‍යස්ථානය - කොටදෙණියාව

## කිරිගව පාලන සහායක (NVQ4) පුහුණු පාඨමාලාව සඳහා ආධුනිකයින් බඳවා ගැනීම - 2023

කොටදෙණියාව, සත්ව පාලන පුහුණු මධ්‍යස්ථානය, බස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ පරිපාලනය වන සත්ව පාලනය හා ඒ ආශ්‍රිත ක්ෂේත්‍ර සඳහා පුහුණු හා ව්‍යාප්ති කටයුතු සිදු කරන පළාත් රාජ්‍ය ආයතනයකි.

මෙම ආයතනය තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ පූර්ව ලියාපදිංචිය ලබා ජාතික වෘත්තීය කුසලතා 04 වන මට්ටම සඳහා ප්‍රතීතනය අපේක්ෂිතව සිටී.

මෙම ආයතනය විසින් පවත්වනු ලබන සිව් මාසික පූර්ණ කාලීන, කිරිගව පාලන සහායක පුහුණු පාඨමාලාව සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික, අවිවාහක අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. ආධුනිකයින් බඳවා ගැනීම.

**✻ අවම සුදුසුකම්**

I. අයදුම්කරු අ.පො. ස. (සා.පෙළ) විභාගය අවම සම්මාන 02 කින් සිංහල හා ගණිතය විෂයන් සහිතව විෂයන් 06 කින් එකවර සමත් වී තිබිය යුතුය.

II. අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට වයස අවුරුදු 18ට වැඩි හා අවුරුදු 35ට අඩු යහපත් මානසික හා කායික සෞඛ්‍යයෙන් හෙබි අයෙකු විය යුතුය.

### 02. පුහුණුව සඳහා බඳවා ගන්නා ක්‍රමවේදය

I. පුහුණු පාඨමාලාව සඳහා නේවාසික සිසුන් 20 ක් හා අනේවාසික සිසුන් 20 ක් බඳවා ගැනේ.

අයදුම්කරුවන් සංඛ්‍යාව පාඨමාලාවට ඇතුළත් කර ගත හැකි සංඛ්‍යාව ඉක්මවා ඇති අවස්ථාවක අවම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් විය යුතුය.

II. සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පාඨමාලාව සඳහා බඳවා ගනු ලැබේ.

### 03. අයදුම්පත් ඉදිරිපත් කිරීම් විස්තර

I. බස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු වෙබ් අඩවියට පිවිසීමෙන් අදාළ අයදුම්පත බාගත කළ හැකිය. (www.daph.wp.gov.lk)

II. අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කළ යුතු අතර, නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පළාත් අධ්‍යක්ෂ කාර්යාලය, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත), වැලිසර, රාගම යන ලිපිනය වෙත යොමු කළ යුතුය.

III. මෙම බඳවා ගැනීමට අදාළ වෙනත් තොරතුරු 0332272214 යන දුරකථන අංකයට ඇමතීමෙන් ලබාගත හැකිය.

IV. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2023 මැයි15 වන දින වේ.

### 04. විශේෂ කොන්දේසි

i. පුහුණු පාඨමාලාව සිංහල භාෂා මාධ්‍යයෙන් පවත්වනු ඇත.

ii. මෙම පුහුණු පාඨමාලා වල අධ්‍යයන කටයුතු සඳහා යන සියලු වියදම්, බස්නාහිර පළාත් සභාව මගින් දරනු ලබන අතර, නේවාසික පහසුකම්ද පුහුණු ආයතනය මගින් සපයනු ඇත. එහෙත් පුහුණු කාලය තුළදී ආහාරපාන, භෞතික හා අනෙකුත් පෞද්ගලික වියදම් අභ්‍යාසලාභීන් විසින් දැරිය යුතු වේ.

iii. තෝරා ගනු ලබන අභ්‍යාසලාභීන් අභ්‍යාස ආයතනයේ විනය හා ආචාර ධර්ම වලට යටත්ව පුහුණුව අවසන් කරන බවට මෙන්ම පුහුණු කාලසීමාව සාර්ථකව අවසන් කරන බවට බැඳෙන ගිවිසුමකට අත්සන් කළ යුතුය.

iv. පුහුණු කාලය අවසන් කිරීමට මත්තෙන් පුහුණුවෙන් ඉවත් වන්නේ නම් එතෙක් ඔහු හෝ ඇය වෙනුවෙන් බස්නාහිර පළාත් සභාව මගින් දැරූ වියදම ආපසු ගෙවීමට බැඳී සිටින අතර, ඒ සඳහා වූ ඇප ගිවිසුමකට එළඹිය යුතුය.

v. පුහුණු කාලය අවසානයේදී පවත්වනු ලබන අවසනු ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ වලදී සමත්වන ආධුනිකයන් සඳහා NVQ-Level 04 මට්ටමේ සහතිකයක් පුහුණු ආයතනය විසින් නිකුත් කරනු ලබන අතර, පුහුණුවට ආදාළ රැකියා ලබා දීමට මෙම දෙපාර්තමේන්තුව හෝ පුහුණු ආයතනය බැඳී නොසිටී.

vi. අයදුම්කරුවන් වෙනත් කිසිදු පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී නොතිබිය යුතුය.

**පළාත් අධ්‍යක්ෂ (බටහිර),**
**සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,**
**වැලිසර, රාගම**
**දිනය: 2023. 04.17**

**කිරිගව ගොවිපල සහායක පුහුණු පාඨමාලාව සඳහා අයදුම්පත්‍රය**
**සත්ව පාලන පුහුණු මධ්‍යස්ථානය, කොටදෙණියාව**

1. මුලකුරු සහිත නම :................................................
2. සම්පූර්ණ නම :................................................
3. ජාතික හැඳුනුම්පත් අංකය :................................................
4. උපන් දිනය :................................................
5. ස්ත්‍රී/පුරුෂභාවය :................................................
6. ලිපිනය :................................................
7. මව/පියා/ භාරකරුගේ විස්තර

   මුලකුරු සහිත නම : ................................................

   රැකියාව : ................................................

   ජා.හැ.අං :................................................
8. ඇමතුම් විස්තර :

   o දුරකථන අංක : ................................................

   o WhatsApp අංකය : ................................................

   o විද්‍යුත් තැපැල : ................................................
9. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස (සා.පෙළ) ප්‍රතිඵල

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

පශු සම්පත් ක්ෂේත්‍රයේ උනන්දුව : ................................................

සත්ත්ව පාලනය පිළිබඳ පළපුරුද්ද (ඇත්නම්) : ................................................

ලබා ඇති වෙනත් පශු සම්පත් පුහුණුවක් (ඇත්නම්) : ................................................

මෙම පුහුණු පාඨමාලාව අයදුම් කිරීමට හේතු : ................................................

මා විසින් සපයන ලද ඉහත විස්තර සත්‍ය සහ නිවැරදිය. සත්ව පාලන පුහුණු මධ්‍යස්ථාන ගොවිපලෙහි මාස හතරක කාලයක් නේවාසික/අනේවාසික පුහුණුව ලබා ගැනීමට මම කැමැත්තෙමි.

මම මෙම අයදුම්පත සමග පහත සහතිකවල පිටපත් එවමි .

1. උප්පැන්න සහතිකයේ පිටපතක්
2. ජාතික හැඳුනුම්පතේ / රියදුරු බලපත්‍රයේ/ ගමන් බලපත්‍රයේ පිටපතක්
3. අ.පො ස. සා/පෙළ සහතිකයේ පිටපතක්

අත්සන : ................................................

දිනය : ................................................